**මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------- | ------------------------------ |
| (අ) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ මුදල් රු.3,969,646ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල නිවැරදිව ගණනය කිරීමට නොහැකි නිසා මෙම වටිනාකම හිඟ ලෙස දක්වා නොතිබුණි. |
| (ආ) | මුද්දර ගාස්තු රු.4,755,101ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි වටිනාකම හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල නිවැරදිව තක්සේරු කළ නොහැකි නිසා මෙම වටිනාකම හිඟ ලෙස දක්වා නොතිබුණි. |

#### 1.3.2 ගෙවිය යුතු ගිණුම්
--------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | ------------------------------------ |
| වියදම් ණයහිමියන් ගිණුමේ රු.1,873,377 ක් මේ දක්වා නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් පැවතුණි. | කඩිනමින් නිරවුල් කළ යුතු වීම. | මෙම ශේෂය විධිමත් අයුරින් නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව දන්වා සිටිමි. |

### 1.3.3 ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු. 74,654,941 ක් වටිනා ගිණුම් විෂයන් 05 ක් ඉඩම් ඔප්පු, වත්කම් ලේඛන, තොග ලේඛන, අයිතිය තහවුරු කිරීමේ ලේඛන ආදිය ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සංතොෂක්ෂණය කිරීමට නොහැකි විය. | අදාල අයිතම් සඳහා ලේඛන ඉදිරිපත් කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනය , තොග ලේඛන අප සභාව නඩත්තු කරන නමුත් එහි නිවැරදි තොරතුරු නොමැති නිසා ඉදිරියේදී ඉහත සඳහන් ස්ථාවර වත්කම් පිළිබඳ හිමිකම් ඔප්පු සහ අයිතිය තහවුරු කිරීම් ලේඛන ලබාගැනීමට සුදුසු කටයුතු සහ ඉහත සඳහන් පොත්පත් විධිමත් අයුරින් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලබන බවද දන්වා සිටිමි. |
| (ආ) | වැටුප් ආපසු ගෙවීම් රු. 2,234,160 ක් අවසන් ගිණුම්වල හිඟහිටි ලෙස දක්වා තිබුණත් අදාල වටිනාකම තහවුරු කළ හැකි සාක්ෂි කිසිවක් නොතිබුණි. | කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව

| | විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 41 (2) | 1,199,000 | මෝටර් රථ මිලදී ගැනීමට ප්‍රථම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එම අනුමැතිය ලබාගැනීමකින් තොරව වාහනයක් මිලදී ගෙන තිබුණි. | ඉදිරියේදි නිසි ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතුවේ. | මෙවැනි ක්‍රියාවන් ඉදිරියේදී සිදුනොවන අයුරින් නිසි පටිපාටීන් අනුගමනය කරමින් කටයුතු කරනු ලැබේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | මුදල් අමාත්‍යාංශයේ 2016 මාර්තු 17 දිනැති අංක 1/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 5.2 වගන්තිය | | පූර්ව අනුමැතිය ලබා නොගෙන කැබ් රථය මිලදී ගෙන තිබුණි. | ඉදිරියේදි වාහන මිලදී ගැනීමේදී පූර්ව අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙවැනි ක්‍රියාවන් ඉදිරියේදී සිදුනොවන අයුරින් නිසි පටිපාටීන් අනුගමනය කරමින් කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>(i) 2.11.1 (ඇ) මාර්ගෝපදේශය | 1,924,275 | ප්‍රසම්පාදන ක්‍රියාවලියේදි ප්‍රසම්පාදන කාල සටහන, ප්‍රසම්පාදන ක්‍රමය සහ ලංසු ලේඛන වර්ගය පිළිබඳ එකඟවීමට ප්‍රසම්පාදන කමිටුව සමගත්, තාක්ෂණික කමිටුව සමගත්, සාමූහිකව මූලික රැස්වීමක් පැවැත්විය යුතු වුවත් එවැනි රැස්වීමක් පවත්වා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවේ. | ඉදිරියේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ (එ) 2.11.1 (ඇ) වගන්තියට අනුව ඉහත සඳහන් කමිටු දෙකම එක්වී සාමුහිකව පළමු රැස්වීම පවත්වා තීරණ ගැනීමට කටයුතු කරන බව ඔබ වෙත දන්වා සිටිමි. |
| | (ii) 3.4(ඊ) මාර්ගෝපදේශය | 1,099,650 | මිල ගණන් සඳහා අයැදුම්පත් යොමු කිරීමේ වගකීම අනාවරණය කළ යුතු වුවත්, එයට පටහැනිව මිල ගණන් කැඳවා නොතිබුණි. | විධිමත්ව ක්‍රියාතමක කළ යුතුවේ. | අනාගතයේදි 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4(ඊ) මාර්ගෝපදේශයට අනුව නිවැරදි ලංසු ක්‍රියාවලිය අනුගමනය කර කටයුතු කරන බව දන්වමි. |
| | (iii) 2018 ජුලි 09 දින පළකරනු ලැබූ 34 වැනි අතිරේකයේ 2.14.1 වගන්තිය | | රු.200,000 කට අධික වාහන අලුත්වැඩියා වියදම් සඳහා පූර්ව අනුමැතිය අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලබාගත යුතුය. එසේ වුවත්, මෙයට පටහැනිව සභාව විසින් අංක 53-8521 දරන වාහන අලුත්වැඩියාව සිදුකර තිබුණි. | අනාගතයේදි නිවැරදි ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුවේ. | ඉදිරියේදී 2018 ජුලි 09 දින පළකරනු ලැබූ 34 වැනි අතිරේකයේ 2.14.1 වගන්තිය අනුව මූල්‍ය පරිපාටීන් අනුගමනය කරනු ලැබේ. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පසුගිය සහ සමාලෝචිත වර්ෂයේදී සිදු කළ අවසන් වූ කොන්ත්‍රාත් 05ක් වෙනුවෙන් කොන්ත්‍රාත් කරුවන්ට රු. 740,586 ක් එකතු කළ අගය මත බදු ලෙස ගෙවීම් කර තිබුණත් එම සැපයුම්කරුවන්ගෙන් "වැට් ඉන්වොයිසිය" (VAT Invoice) ලැබී නොතිබුණි. එසේම ගෙවා තිබූ එකතු කළ අගය මත බදු පිළිබඳව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිට දැනුම් දී නොතිබුණි. | අනාගතයේදි මෙම කටයුතු විධිමත් අයුරින් කළ යුතුය. | මෙවැනි වැරදි සිදුනොවිමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,295,664 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,190,480 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ විස්තර පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත ආදායම් | ලැයිස්තු ගත කළ ආදායම් | අය කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | ලැයිස්තු ගත කළ ආදායම් | අය කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | - | -- | -- | -- | - | -- | -- | -- |
| කුලී | 3,011,052 | 3,011,052 | 3,011,052 | -- | 2,000,000 | 4,379,628 | 4,379,628 | - |
| බලපත්‍ර ගාස්තු | 1,024,061 | 1,024,061 | 1,024,061 | -- | 1,250,000 | 1,264,365 | 1,264,365 | -- |
| අනෙකුත් ආදායම් | 37,065,372 | 37,065,372 | 38,457,841 | -- | 8,500,000 | 3,661,077 | 3,661,077 | - |
| එකතුව | **41,100,485** | **41,100,485** | **42,492,954** | - | **11,750,000** | **9,305,070** | **9,305,070** | - |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) බිල් කළ ආදායම<br>බිල් කළ ආදායම ගණනය නොකර වර්ෂය සඳහා ලැබූ ප්‍රමාණය වර්ෂයේ ආදායම ලෙස සැලකීම නිසා අයකළ යුතු ඉතිරි ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් නොකෙරේ. | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | සමලෝචිත වර්ෂයේ අස්ථාවර කිසිදු ආදායමක් හිඟ වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. |
| (ආ) වරිපනම් බදු<br>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උප වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අයකරනු ලබන බව තීරණය කර තිබූ නමුත්, සභා බලප්‍රදේශය තුළ පවතින ප්‍රදේශ සංවර්ධනය වූ ප්‍රදේශ බවට ගැසට් ගතකර සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි අනාගතයේදි සුදුසු කටයුතු කරන බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) තනතුරු පුරප්පාඩු සහ අතිරික්තයන්<br>සභාවට අයත් පුස්තකාල 07ක් සඳහා පුස්තකාලයාධිපතිවරුන් දෙදෙනෙකුගේ අනුමත සේවක සංඛ්‍යාවක් පැවැති නමුත් මේ දක්වා කාලයක් පුරප්පාඩු එකක් පුරවා නොතිබුණි. | සේවක මණ්ඩලය අනුමත කර ගැනීමට කඩිනමින් ක්‍රියා මාර්ග ගත යුතුවේ. | මෙම පුස්තකාල සඳහා පුස්තකාලයාධිපතිවරුන් නොමැතිවීමට හේතුව සේවක සංඛ්‍යාව අනුමත නොකිරීම වේ. |
| (ආ) සභාවට අයත් වාහන 16 ක් සඳහා අනුමත කළ රියැදුරු සංඛ්‍යාව 06දෙනෙකු වුවත්, දෙදෙනෙකු පමණක් සිටින බැවින් පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | පරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | රියැදුරු පුරප්පාඩු 04ක් පවතින නමුත් පුරප්පාඩු පිරවීම සඳහා කිහිප අවස්ථාවකදීම සම්බන්ධිත උසස් බලධාරීන්ට ලිපි මගින් දැනුම් දීම් සිදු කර තිබුණද මේ දක්වා පුරප්පාඩු නොපුරවා තිබුණි. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේපල බදු දීමේදී ඇප නොලබා ගිවිසුම් අත්සන් කර තිබුණි. | බදුදීමේදී දේපල ඇප ලබාගැනීමට කටයුතු කලයුතු වේ. | අනාගතයේදි දේපල ඇප වශයෙන් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 නඩත්තුව හා අලුත්වැඩියා සිදුකිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගබඩා කාමරයේ විවිධ වත්කම් සහ තොග අයිතමයන් භාවිතයට සුදුසු සහ නුසුදුසු අයිතමයන් ලෙස සලකුණු කර ඒවා අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි මගින් විකිණීමට හෝ කටයුතු කර නොතිබුණි. | අනාගතයේදි මෙම කටයුතු විධිමත්ව කළ යුතුවේ. | අප සභාවේ ගබඩාවේ පවතින වාර්තා මගින් විකිණීමට විධිමත් අනුමැතිය ලබා ඒවා විකිණීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සභාවට අයත් Hand Tractor 01ක්, Land Vehicle 02ක්, Tractor Tailor – 02ක් ආදිය අලුත්වැඩියා කර භාවිතා කළ හැකිව තිබුණත් වර්ෂ හතරක හෝ පහකට අධික කාලයක සිට අලුත්වැඩියා නොකර නිෂ්ක්‍රීයව පැවතුණි. | යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ උපදෙස් ලබා අවශ්‍ය කටයුතු කල යුතුවේ. | සභාවට අයත් Hand Tractor – 01, Land Vehicle – 02, හා Tractor Tailor – 02 යන වාහන අලුත්වැඩියා කර භාවිතා කළ හැකිව තිබුණත් මෙම වාහනවලින් Hand Tractor – 01 හැර අනෙකුත් වාහන අලුත්වැඩියා කර ධාවනයේ යොදවා ඇත. Hand Tractor – 01 අලුත්වැඩියා කළ නොහැකි අතර එම වාහනය යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ වාර්තාව ලබාගැනීමෙන් පසුව එය විකිණීමට කටයුතු කරන බව ඔබ වෙත දන්වා සිටිමි. |
| (ඇ) | අත් ට්‍රැක්ටරයක්, Tractor Trailer එකක් 2011 සහ 2015 වර්ෂවල සිට නිෂ්කාර්යව පැවතුණු නමුත් ඒවා අපහරණය කිරීමට හෝ විකිණීමට කටයුතු කර නොතිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ උපදෙස් ලබා අවශ්‍ය කටයුතු කලයුතු වේ. | අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින නිසා එම වාහනය ඉංජිනේරුවරයාගේ වාර්තාව ලබාගැනීමෙන් පසුව එය විකිණීමට කටයුතු කරන බව ඔබ වෙත දන්වා සිටිමි. |

**3.3.2 වත්කම්වලින් ලබාගත යුතු ආදායම් ලබාගැනීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් කඩකාමර 04 ක් බදු දී නොමැති වීමෙන් ආසන්න වශයෙන් රු.99,000ක ආදායම් අහිමි වී තිබුණි. | බදු දීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි මෙම කඩකාමර බදු දිමට කටයුතු කරනු ලැබේ. |

**3.4 ප්‍රසම්පාදනය**

**3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී අප සභාව විසින් සැපයුම් හා සේවා ක්‍රියාකාරකම් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |